# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2019 (පැරණි නිර්දේශය)

## 41 - බුද්ධ ධර්මය

## ප්‍රශ්නපත්‍ර ව්‍යුහය හා ලකුණු බෙදීයාම

**I - පත්‍රය** - **කාලය : පැය 02 යි**

වරණ 05 බැගින් වූ බහුවරණ ප්‍රශ්ණ 50 කි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුයි. එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 කි.

**II - පත්‍රය** - **කාලය : පැය 03 යි**

මෙම ප්‍රශ්න පත්‍රය I හා II වශයෙන් කොටස් දෙකකින් යුක්තය.

I කොටස - ව්‍යුහගත ප්‍රශ්න 03 කින් ප්‍රශ්න 02 කට පිළිතුරු සැපයිය යුතුය. එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් ලකුණු 40 කි.

II කොටස - රචනා වර්ගයේ ප්‍රශ්න 05 කි. ප්‍රශ්න 03 කට පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් ලකුණු 60 කි.

අවසාන ලකුණ ගණනය කිරීම : I පත්‍රය = 100
II පත්‍රය = 100

**අවසාන ලකුණ : 200 ÷ 2 = 100**

# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.

2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.

3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.

4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමග □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) ..................................................... √ △ $\frac{4}{5}$

(ii) ..................................................... √ △ $\frac{3}{5}$

(iii) ..................................................... √ △ $\frac{3}{5}$

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.

2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.

3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

### ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

### ලකුණු ලැයිස්තු සකස් කිරීම :

මෙවර සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රය සඳහා බහුවරණ පිළිතුරු පත්‍රයක් පමණක් ඇති විට ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කිරීමෙන් පසු අකුරෙන් ලියන්න. අනෙකුත් උත්තරපත්‍ර සඳහා විස්තර ලකුණු ඇතුළත් කරන්න. 51 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර අකුරෙන් ද ලිවිය යුතු වේ.

***

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

2019.08.05 / 0830 - 1030

බුද්ධ ධර්මය I
பௌத்தம் I
Buddhism I

41 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

- ✳ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ✳ උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
- ✳ උත්තර පත්‍රයේ, පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- ✳ **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ම ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**
- ✳ එක් ප්‍රශ්නයකට ලකුණු **02** බැගින් මුළු ලකුණු **100** යි.

**1.** තම තමන් පිළිගත් මතවාද දිනවනු පිණිස බුද්ධ කාලීනව විසූ ශ්‍රමණ-බ්‍රාහ්මණයන් විවිධාකාරයෙන් වාද විවාදවල නිරත වූ බව පෙළ සාහිත්‍යයෙන් පෙනේ. එහි ලා බුදුරදුන්ගේ විශේෂත්වයක් වූයේ,
(1) වෙනත් මහණ බමුණන් වාද කොට පැරදවීම ය.
(2) මතුවන ප්‍රශ්න කිසිවක් පසෙකින් නොතැබීම ය.
(3) සෙසු ශ්‍රමණ-බ්‍රාහ්මණයන් සමග වාදයට නොයාම ය.
(4) තමන් වහන්සේ වාදයට නොගොස් ජ්‍යෙෂ්ඨ ශ්‍රාවකයන් පිටත් කර හැරීම ය.
(5) සුදුසු අවස්ථාවල දී පමණක් සෙසු මහණ බමුණන් සමග වාද කිරීම ය.

**2.** වරක් බුදුරජාණන් වහන්සේගේ ආශ්චර්යමත් බව පිළිබඳ ව භික්ෂූන් වහන්සේලා අතර උපන් කතාබහක් සැළ වූ පසු බුදුරජාණන් වහන්සේ ආනඳ මාහිමියන් අමතා "තථාගතයන් වහන්සේගේ ආශ්චර්ය අද්භූත බව ඔබට වැටහේවා"යි කරුණු දහනවයක් වදාළ හ. ඉන් එකක් නම්,
(1) අනේකවිධ සෘද්ධිප්‍රාතිහාර්ය දැක්වීමට හැකිවීම ය.
(2) බෝසත් අවධියේ දී ම ආනාපාන සතිය වැඩීම ය.
(3) මව්කුස පිළිසිඳ ගත් බෝසතුන්ට සිව්වරම් දෙවියන්ගේ රැකවරණ ලැබීම ය.
(4) යමාමහ පෙළහර පෑමට තිබූ හැකියාව ය.
(5) සියලු සත්ත්වයන්ගේ ආසයානුසය දැන සිටීම ය.

**3.** බුදුරජාණන් වහන්සේ සුවිශේෂ කායික ලක්ෂණ දෙතිසකින් යුක්ත වූ බව පාලි සූත්‍ර දේශනාවල සඳහන් වේ. ඉන් එකක් වන 'එණිජංඝෝ' යන්නෙහි අර්ථය වන්නේ,
(1) සමතලා පතුල් දෙකක් ඇති බව ය.
(2) සිංහයකුගේ මෙන් මනාව වැඩුණු උඩුකයක් ඇති බව ය.
(3) උරහිස් දෙක අතර කුහර නැති බව ය.
(4) මුවකුගේ මෙන් කෙමෙන් වට වූ කෙණ්ඩා ඇති බව ය.
(5) දුවිලි නොරැඳෙනා සමක් ඇති බව ය.

**4.** බුදුරජාණන් වහන්සේ තුළ ඇති නව අරහාදී ගුණ අතුරෙන් එකක් විජ්ජාචරණ සම්පන්න නම් වේ. එහි විජ්ජා යන්නෙන් ඥාණාධිගමයන් අටක් ප්‍රකාශ වන අතර ඉන් එකක් නම්,
(1) අකම්පන ඥාණයයි.
(2) මහාකරුණා සමාපත්ති ඥාණයයි.
(3) විදර්ශනා ඥාණයයි.
(4) ආසයානුසය ඥාණයයි.
(5) සබ්බඤ්ඤුත ඥාණයයි.

**5.** සත්‍ය ගවේෂණයෙහි නිරත වූ සිද්ධාර්ථ ගෞතම බෝධිසත්ත්වයන් වහන්සේ ආලාරකාලාම, උද්දකරාමපුත්ත ආචාර්යවරුන් සමීපයෙහි සමයවාදයන් ප්‍රගුණ කළ බව සඳහන් වේ. පසුව උන්වහන්සේ එම ආචාර්යවරුන් ඇසුරෙන් ඉවත් වූයේ,
(1) ඔවුන් මිථ්‍යාදෘෂ්ටිකයන් වූ බැවිනි.
(2) ඔවුන් අත්තකිලමථානුයෝගීන් වූ බැවිනි.
(3) ඔවුන්ගේ ශ්‍රාවකයන්ගෙන් අඩක් භාර ගැනීමට එකඟ නොවූ බැවිනි.
(4) ඔවුන්ගෙන් උගත යුතු කිසිවක් නොවූ බැවිනි.
(5) ඔවුන්ට චිත්ත සමථය ඉක්මවා යාමට නොහැකි බව පෙනීයාමෙනි.

**6.** දහම් වැදීම සඳහා භාවිත කරනු ලබන පාඨයෙහි '**පච්චත්තං වේදිතබ්බො විඤ්ඤූහි**' යන්නෙන් අදහස් වන්නේ,
(1) ධර්මය ප්‍රත්‍යක්ෂයෙන් දත යුතුය යන්නයි.
(2) නිවන් පසක් කිරීමට උපකාරී වේ යන්නයි.
(3) නුවණැතියන් විසින් වෙන් වෙන්ව හිඳ අවබෝධ කළ යුතු යන්නයි.
(4) සසර වසන සත්ත්වයන් නිවනට පමුණුවන යන්නයි.
(5) නිවැරදි ප්‍රතිපදාවට යොමු කරවන යන්නයි.

**7.** චතුරාර්ය සත්‍යය යනු උත්තරීතර මනුෂ්‍යයකු වන බුදුරජාණන් වහන්සේ විසින් දුක හා දුකින් මිදීම පැහැදිලි කරමින් කරන ලද දේශනාවක් මිස දේව අනාවරණයක් නො වේ. ඒ බව සෘජුව ම ප්‍රකාශ වනුයේ,
(1) ධම්මසංගිණී ප්‍රකරණයෙහි ය.
(2) චුල්ලවග්ගපාළියෙහි ය.
(3) විශුද්ධි මාර්ගයෙහි ය.
(4) ධම්මචක්කප්පවත්තන සූත්‍රයෙහි ය.
(5) මිලින්ද ප්‍රශ්නයෙහි ය.

**8.** "ලෝභය ද ද්වේෂය ද මෝහය ද අකුසල චේතනාවෝ ය. ඒවා අහිත පිණිස, දුක් පිණිස වේ. අලෝභය ද අද්වේෂය ද අමෝහය ද කුසල චේතනාවෝ ය. ඒවා හිත සුව පිණිස වේයැ'යි නිදහස්ව සිතා තීරණය කළ යුතුයැ'යි" බුදුරදුන් විසින් දේශනා කරන ලද්දේ,
(1) සුභ මානවකයාට ය.
(2) උපාලි ගෘහපතියාට ය.
(3) මහානාම ශාක්‍යයන්ට ය.
(4) රාහුල තෙරුන් වහන්සේට ය.
(5) කාලාම ගෝත්‍රිකයන්ට ය.

**9.** සියල්ල ඇත ශාස්වතය, සියල්ල නැත අශාස්වතය යන උභයාන්තය ම පසෙකින් තැබූ බුදුරජාණන් වහන්සේ කච්චානගොත්ත සූත්‍රයෙහි ප්‍රකාශ කොට ඇත්තේ,
(1) පටිච්චසමුප්පාදයයි.
(2) සප්ත විශුද්ධියයි.
(3) චතුරාර්ය සත්‍ය ධර්මයයි.
(4) ත්‍රිලක්ෂණ දේශනාවයි.
(5) අරිඅටඟි මගයි.

**10.** මෙලොව සුවසෙත මෙන් ම පරලොව සුවසෙත ද තමාගේ යහපත මෙන් ම අනුන්ගේ යහපත ද සමබරව සාධනය කරගැන්මට අදාළ උපදෙස් බුද්ධ දේශනාවල නොයෙක් තැන විසිර තිබේ. පහත දැක්වෙන ධර්ම පාඨ අතුරෙන් එම උපදේශය ප්‍රකාශ **නොවන** පාඨය කුමක් ද?
(1) දිට්ඨෙව ධම්මේ යෝ චත්ථෝ යෝ චත්ථෝ සම්පරායිකෝ
(2) අත්තහිතාය පටිපන්නෝ පරහිතාය ච
(3) ද්විචක්ඛුං පන සේට්ඨං සෙට්ඨං පුරිස පුග්ගලං
(4) කතපුඤ්ඤෝ උභයත්ථ නන්දති
(5) අත්තනාව සුදන්තෙන නාථං ලභථ දුල්ලභං

**11.** බුද්ධකාලීන භාරතීය ශ්‍රමණ ගුරුකුලවල දක්නට ලැබුණු පොදු ලක්ෂණයක් වන්නේ,
(1) නිර්මාණවාදී වීම ය.
(2) අත්තකිලමථානුයෝගී වීම ය.
(3) භාවනාව පිළිගැනීම ය.
(4) බ්‍රහ්මචාරී වීම ය.
(5) ආජීවකයන් වීම ය.

**12.** උපසපන් භික්ෂූන් වහන්සේ නමකට ලබා දිය යුතු අවවාද සතරක් විනය මහාවග්ගයේ සඳහන් වේ. ඒවා නිස්සය ධර්ම නම් වන අතර ඉන් එකක් නම්,
(1) පැවිද්දන් සමගියෙන් ක්‍රියා කළ යුතුය යන්නයි.
(2) වැඩිහිටි භික්ෂූන්ට වතාවත් කළ යුතුය යන්නයි.
(3) ප්‍රාතිමෝක්ෂ ශික්ෂාවන්ට අනුව හික්මිය යුතුය යන්නයි.
(4) පැවිද්ද රුක්මුල්, සෙනසුන් ඇසුරු කිරීම පිණිසය යන්නයි.
(5) බොහෝ ජනයාගේ හිතසුව පිණිස දහම් දෙසිය යුතුය යන්නයි.

**13.** "යම් භික්ෂුවක් කෙලෙස් නැති කිරීමට සමත් වූ මාර්ගඵලාදිය නොලැබ ම ඒවා තමා වෙත ඇතැයි" පවසයි නම් පරිජි වේ. සතර පාරාජිකාවන්ගෙන් එකක් වන මෙය හැඳින්වෙන්නේ,
(1) උත්තරිමනුස්සධම්ම යනුවෙනි. (2) සංඝාදිසේස යනුවෙනි.
(3) අකරණීය යනුවෙනි. (4) මනුස්සවිග්ගහ යනුවෙනි.
(5) පාටිදේසනීය යනුවෙනි.

**14.** බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා වෙතින් ප්‍රකට වන සුවිශේෂී ගුණ අතර ඤායපටිපන්න යනු,
(1) දන් පිළිගැන්වීමට සුදුසු යන්නයි. (2) නිවැරදි පිළිවෙතෙහි පිහිටි යන්නයි.
(3) ඍජු මාර්ගයෙහි ගමන් කරන යන්නයි. (4) විදර්ශනා මාර්ගයට සපැමිණි යන්නයි.
(5) දුරසිට ගෙන එන පූජාවන්ට ද යෝග්‍ය යන්නයි.

**15.** භික්ෂු සමාජය ආරම්භයේ දී බුදුරදුන් විසින් විහාර සෙනසුන් අනුදැන නොතිබූ බැවින් භික්ෂූහු ආරණ්‍ය වෘක්ෂමූල ආදියෙහි දිවා රෑ ගත කළහ. බුදුරදුන්ගේ ද අනුමැතිය ඇතිව පළමුවරට විහාර සේනාසන තනවා පූජා කරන ලද්දේ,
(1) අනේපිඬු සිටුතුමන් විසිනි. (2) බිම්බිසාර මහරජතුමන් විසිනි.
(3) රජගහ නුවර සිටුතුමන් විසිනි. (4) විශාඛා මහෝපාසිකාව විසිනි.
(5) ජීවක වෛද්‍යාචාර්යතුමන් විසිනි.

**16.** ගිහි පැවිදි ශ්‍රාවක-ශ්‍රාවිකාවන්ගේ විශේෂ කුසලතා සැලකිල්ලට ගනිමින් බුදුරදුන් විසින් ඔවුන් අගතනතුරුවලට පත් කළ ආකාරය ඒතදග්ගපාළියෙන් හෙළි වේ. ඒ අනුව ජීවක කෝමාරභච්චයන්ට හිමි වූයේ,
(1) රෝගී භික්ෂූන් සුවපත් කරන්නවුන් අතර අග තනතුරයි.
(2) විශ්වාස කටයුතු වදන් ඇත්තන් අතර අග තනතුරයි.
(3) අචල ප්‍රසාදය ඇති උවසුවන් අතර අග තනතුරයි.
(4) සංඝයාට උවටැන් කරන උවසුවන් අතර අග තනතුරයි.
(5) පුද්ගල ප්‍රසාදය දිනාගත් උවසුවන් අතර අග තනතුරයි.

**17.** ථෙරවාද ධර්ම සංගායනා පැවැත්වීමට තුඩු දුන් ශාසනික පසුබිම, එම සංගායනා පිළිබඳ සංවිධාන කටයුතු, ඒවායේ ප්‍රතිඵල ආදී කරුණු හෙළිකර ගැනීමට උපකාරී වන ප්‍රාථමික මූලාශ්‍රය රාශියකි. ඒවා අතුරෙන් පාලි ත්‍රිපිටකයට ඇතුළත් වන්නේ,
(1) දීපවංශයයි. (2) නිකාය සංග්‍රහයයි.
(3) මහාවංශයයි. (4) සමන්තපාසාදිකාවයි.
(5) චුල්ලවග්ගපාළියයි.

**18.** ප්‍රථම ධර්ම සංගායනාව පැවැත්වීමට තුඩුදුන් ආසන්නතම හේතුව සුභද්‍රගේ අභද්‍ර ප්‍රකාශය වුව ද තවත් ශාසනික ගැටලු රැසක් ඒ පසුබිමෙහි විද්‍යමාන වූ බව මූලාශ්‍රය ඇසුරෙන් පෙන්වා දිය හැකි ය. ඉන් එකක් නම්,
(1) ඇතැම් භික්ෂූන් වහන්සේලා නොයෙකුත් විෂමාචාරවල නිරත වීම ය.
(2) මහායාන අදහස් පැතිර යාම ය.
(3) භික්ෂූන් ගුරුකුල වශයෙන් බෙදී යාම ය.
(4) අනාගතයේ දී අධර්මය මතු වී ධර්මය යටපත් වනු ඇතැ'යි ජ්‍යෙෂ්ඨ භික්ෂූන්ට පෙනීයාම ය.
(5) භික්ෂූන් පොහෝ පවුරුණු ආදිය නොකිරීම ය.

**19.** දෙවන ධර්ම සංගායනාව පැවැත්වීමට ආසන්න හේතුව ලෙස දැක්වෙන්නේ විශාලා මහනුවර වජ්ජිපුත්‍රක භික්ෂූන් විසින් පිළිගත් දස අකැප වස්තුවයි. එහි ජලෝගිකප්ප යන්නෙන් අදහස් වන්නේ,
(1) ඇදුරු පරපුරේ කළ දැ එසේම කිරීම යන්නයි.
(2) රන්රිදී මසුකහවනු පිළිගැනීම කැපය යන්නයි.
(3) නොපැසුණු රා පානය කිරීම කැපය යන්නයි.
(4) කිරිත්, දීකිරිත් නොවූ විකෘතිය වැළඳීම කැපය යන්නයි.
(5) දාවලු නැති නිසීදනයක් භාවිත කිරීම කැපය යන්නයි.

**20.** බුද්ධ පරිනිර්වාණයෙන් තෙමසක් ඇවෑමෙන් පැවැති ප්‍රථම සංගීති අවස්ථාවේ බුද්ධදේශිත ධර්මවිනය මතුවට පවත්වාගෙන යෑමට ගුරු-ශිෂ්‍ය පරම්පරාවලට පවරන ලදී. එහිදී අංගුත්තර නිකාය පවරන ලද්දේ,
(1) දම්සෙනෙවි සැරියුත් මාහිමියන් ඇතුළු සිසු පරපුරටයි.
(2) අනුරුද්ධ හිමියන් ප්‍රමුඛ සිසු පරපුරටයි.
(3) රාහුල මාහිමියන්ගේ ශිෂ්‍ය පරම්පරාවටයි.
(4) මහාකාශ්‍යප මාහිමියන් ප්‍රධාන සිසු පරපුරටයි.
(5) මුගලන් මාහිමියන්ගේ ශිෂ්‍ය පරම්පරාවටයි.

**21.** බුදුරදුන් විසින් දේශිත ධර්මයත්, පැනවූ විනයත් පිටක වශයෙන් ත්‍රිවිධ ය. එහි විනය යැයි කියනු ලබන්නේ,
(1) මැනවින් ප්‍රකාශ කර ඇති බැවිනි.
(2) සසුනේ ආයුෂය වේ යන අර්ථයෙනි.
(3) ධර්මයට අතිරේක වශයෙන් වදාළ බැවිනි.
(4) අර්ථය මැනවින් එළිදක්වන බැවිනි.
(5) විශේෂ නය ක්‍රම ඇති බැවිනි.

**22.** සූත්‍ර පිටකයේ සැකැස්ම පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) දීඝනිකාය වර්ග පහකින් යුක්ත ය.
(2) අංගුත්තර නිකායෙහි නිපාත විස්සකි.
(3) සීලක්ඛන්ධ වර්ගය ඇතුළත් වන්නේ සංයුත්ත නිකායෙහි ය.
(4) මජ්ඣිම නිකාය පණ්ණාසක තුනකි.
(5) කෝසල සංයුත්තය ඇතුළත් වන්නේ ඛුද්දක නිකායෙහි ය.

**23.** සූත්‍ර පිටකය නිකාය වශයෙන් කොටස් පහකට බෙදන ලද්දේ පළමු සංගායනා අවස්ථාවේදී ම ය. එහිදී එක් එක් නිකාය ග්‍රන්ථය හඳුන්වන ලද්දේ ඒවාට ඇතුළත් දේශනාවල ස්වභාවය සැලකිල්ලට ගනිමිනි. ඒ අනුව සංයුත්ත නිකාය යනු,
(1) ඒකක, දුක ආදී වශයෙන් අංක ක්‍රමයට ධර්ම කරුණු ඉදිරිපත් කිරීමකි.
(2) සාරාංශ වශයෙන් බුද්ධ වචනය ප්‍රකාශ කිරීමකි.
(3) ප්‍රමාණයෙන් දීර්ඝ දේශනා මෙන් ම කුඩා දේශනා ද ඇතුළත් කිරීමකි.
(4) විවිධ දහම් කරුණු සම්මිශ්‍රණය කිරීමකි.
(5) ධර්මය මැනවින් ප්‍රකාශ කිරීමකි.

**24.** විනය පිටකය සුත්ත, විභංග, ඛන්ධක හා පරිවාර යනුවෙන් තුන් ආකාර වේ. වත්තක්ඛන්ධකය ඇතුළත්ව ඇත්තේ,
(1) පාරාජිකපාළියේ ය.
(2) මහාවග්ගපාළියේ ය.
(3) චුල්ලවග්ගපාළියෙහි ය.
(4) පාචිත්තියපාළියේ ය.
(5) පරිවාරපාළියේ ය.

**25.** චිත්ත, චෛතසික, රූප, නිබ්බාන යන පරමාර්ථ ධර්ම විභාග කොට දැක්වීම අභිධර්ම පිටකයේ විෂය ක්ෂේත්‍රයයි. එය හැඳින්විය හැක්කේ,
(1) වෝහාර දේශනා යනුවෙනි.
(2) සාමුක්කංසික දේශනා යනුවෙනි.
(3) පරමත්ථ දේශනා යනුවෙනි.
(4) පරියාය දේශනා යනුවෙනි.
(5) නීතත්‍ථ දේශනා යනුවෙනි.

**26.** බුද්ධකාලීන භාරතයේ විසූ බ්‍රාහ්මණයන් මෙන් ම ශ්‍රමණයන් ද කිසියම් පරම නිෂ්ඨාවක් වෙත ශ්‍රාවකයන් මෙහෙයවූ අතර බමුණු දහම අනුව එම නිෂ්ඨාව හඳුන්වන ලද්දේ,
(1) කේවලත්වය යනුවෙනි.
(2) බ්‍රහ්ම සහව්‍යතාව යනුවෙනි.
(3) සංසාර ශුද්ධිය යනුවෙනි.
(4) අසංඛතය යනුවෙනි.
(5) ඉෂ්ටාපූර්තය යනුවෙනි.

**27.** සර්වබලධාරී බ්‍රහ්මයකු ඇතැ'යි ද, වේදය ඔහු විසින් ප්‍රකාශිතයැ'යි ද පුරාණ ඍෂිවරුන් මගින් බමුණන්ට එය ලැබුනේ යැයි'ද වෛදික සම්ප්‍රදාය පිළිගනී. එම ඉගැන්වීම බැහැර කරමින් බුදුදහම කරුණු දක්වා ඇත්තේ,
(1) දම්සක් පැවතුම් සූත්‍රයේ ය.
(2) බ්‍රාහ්මණ ධම්මික සූත්‍රයේ ය.
(3) බ්‍රහ්මවිහාර සූත්‍රයේ ය.
(4) චංකි සූත්‍රයේ ය.
(5) තෙවිජ්ජ සූත්‍රයේ ය.

**28.** බුද්ධකාලීන භාරතයේ මහ පිරිස් පිරිවරා සිටි ප්‍රසිද්ධ ශාස්තෘවරුන් සදෙනෙකු වූ බව සඳහන් වේ. විවිධ මතවාද දැරූ ඔවුන් සියලු දෙනාට ම පොදු ඉගැන්වීමක් වූයේ,
(1) සියල්ල සැකයට භාජනය කිරීම ය.
(2) නිර්මාණවාදය නොපිළිගැනීම ය.
(3) කර්ම විපාක බැහැර කිරීම ය.
(4) වීර්යය, උත්සාහය නිෂ්ඵලයැ'යි ඉගැන්වීම ය.
(5) සියල්ල පූර්ව කර්මානුරූපීයැ'යි පිළිගැනීම ය.

**29.** පහත දැක්වෙන ප්‍රකාශ අතරෙන් ධර්මානුකූල **නොවන්නේ** කුමක් ද?
(1) සියලු සංඛත ධර්ම ත්‍රිලක්ෂණයෙන් යුක්ත වේ.
(2) අස්මිමානය උගුලුවාලීමට අනිත්‍ය සංඥාව වැඩිය යුතු ය.
(3) ත්‍රිලක්ෂණය සිත්හි ලා වැඩීම විපස්සනාවයි.
(4) ඛන්ධායතන ධාතු ත්‍රිලක්ෂණයට යටත් වේ.
(5) ධ්‍යාන සමාපත්ති තුළින් උපදින සැපය අනිත්‍ය නො වේ.

**30.** මිනිස් සමාජයේ ප්‍රභවය හා පරිණාමය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් ඉදිරිපත් කෙරෙන ප්‍රධාන මූලාශ්‍රය දීඝ නිකාය අග්ගඤ්ඤ සූත්‍රයයි. එම සූත්‍රය,
(1) සමාජය සමතාවෙන් විෂමතා වෙත විකාසය වූ බව නොපිළිගනී.
(2) හේතුඵල ධර්මයට අනුගත වේ.
(3) සමාජ පරිණාමයට තුඩු දුන් මානසික සාධක නොදක්වයි.
(4) වර්ණාශ්‍රම ධර්ම පිළිගනී.
(5) කර්මානුරූපව ම සුවදුක් ලැබෙන බව උගන්වයි.

**31.** බුදුරජාණන් වහන්සේ විසින් තමන් වහන්සේ බුදුබව ලබනු පිණිස වීර්ය වැඩූ රමණීය පරිසරය වර්ණනා කර ඇත්තේ,
(1) වනරෝප සූත්‍රයේ ය.
(2) මිලින්ද ප්‍රශ්නයේ ය.
(3) පට්ඨානප්‍රකරණයේ ය.
(4) අරියපරියේසන සූත්‍රයේ ය.
(5) පරිවාරපාළියේ ය.

**32.** ගෘහස්ථ දිවිපැවැත්මෙහි සාර්ථකත්වය සඳහා සමාජ සංස්ථා අතර ක්‍රියාත්මක විය යුතු සාරධර්ම මාලාවක් සිගාල සූත්‍රයේ සදිසා නමස්කාරයේ දැක්වේ. ඒ අනුව ශ්‍රමණ-බ්‍රාහ්මණයන් විසින් ගෘහස්ථ ප්‍රජාවට අනුශාසනා කළ යුත්තේ,
(1) පින් දහම් කිරීමට ය.
(2) මෝක්ෂය ලබා ගැනීමට ය.
(3) වැඩිහිටියන්ට සැලකීමට ය.
(4) ස්වර්ග මාර්ගයෙහි යාමට ය.
(5) පුදසිරිත් පැවැත්වීමට ය.

**33.** අනේක පරියායෙන් කරුණු පැහැදිලි කිරීම බුදුදහමේ විශේෂ ලක්ෂණයකි. ඒ අනුව ධර්මය තුළ සසර දුක පැහැදිලි කර ඇති අවස්ථාව කුමක් ද?
(1) දුක්ඛේන සුඛං අධිගන්තබ්බං
(2) ඒතං මම එසෝ හමස්මිං, එසෝමේ අත්තා
(3) කිච්ඡංවතායං ලෝකෝ ආපන්නෝ
(4) සයං කතං දුක්ඛං
(5) අත්තකිලමථානුයෝගෝ දුක්ඛෝ

**34.** බුදුරදුන් වදාළ සසර දුක නූතන විද්වතුන් විසින් දෙයාකාරයකින් හඳුනාගෙන තිබේ. එනම් සන්තානගත දුක හා සංස්ථාගත දුක යනුවෙනි. බුද්ධ දේශනා අතර සංස්ථාගත දුක පැහැදිලි කොට ඇත්තේ,
(1) චක්කවත්තිසීහනාද සූත්‍රයේ ය.
(2) සිගාල සූත්‍රයේ ය.
(3) මහාදුක්ඛක්ඛන්ධ සූත්‍රයේ ය.
(4) මහානිදාන සූත්‍රයේ ය.
(5) ධම්මික සූත්‍රයේ ය.

**35.** ආර්ය අෂ්ටාංගික මාර්ගය යනු බෞද්ධ විමුක්ති මාර්ගයයි. එසේම එය ජීවන ප්‍රතිපදාවක් ද වෙයි. එම ප්‍රතිපදාවෙහි ඇතුළත් සම්මා කම්මන්තය අනුව,
(1) දැහැමි රැකීරක්ෂාවල නිරත විය යුතු ය.
(2) කයින් සිදුවන අකුසල් තුනෙන් වැළකී සිටිය යුතු ය.
(3) නොකළ යුතු වෙළඳාම් නොකළ යුතු ය.
(4) රාජ්‍ය සේවයෙහි ද නිරත විය හැකි ය.
(5) උත්සාහයෙන් ධනය ඉපයිය යුතු ය.

**36.** ගුණධර්මවලින් තොර මිනිසා තිරිසන් සතෙකුට සමාන බව බුදුදහම පෙන්වා දෙයි. කරුණු එසේ වුව ද ධර්මානුකූලව සලකන විට නිවැරදි වන්නේ,
(1) පව්කම් කළ මිනිසකුට විමුක්තියක් නැත යන්නයි.
(2) මිනිසකුට කිසිසේත් ම දේවානුභාවය ඉක්මවිය නොහැකිය යන්නයි.
(3) මිනිසකු සතු මානසික ශක්තිය කායික ශක්තිය ඉක්මවන්නේය යන්නයි.
(4) මනුෂ්‍ය ඝාතනයක් කළ විට උපසපම්පදාව අහිමි වෙයි යන්න ය.
(5) දෙවියන්ට ද පාරමිතා පිරීමට හැකියාව ඇත යන්නයි.

**37.** පුහුදුන් සත්ත්වයන්ගේ සිත් සතන් තුළ නීවරණ පහක් උපදනා බව බුද්ධ දේශනාව උගන්වයි. සමථ භාවනාවෙන් යටපත් කළ හැකි එම නීවරණ අතර උද්ධච්ච කුක්කුච්ච නීවරණයෙන් අදහස් වන්නේ,
(1) මහන්තත්තකම හා සැකමුසු බවයි.
(2) උඩගුකම හා කුහක බවයි.
(3) තමා උසස් කොට අන් අය පහත් කොට සැලකීමයි.
(4) නොසන්සුන් බව හා පසුතැවිල්ලයි.
(5) උද්දාමය හා කුලෑටිකමයි.

**38.** බුදුදහම අනුව යෝගාවචරයකුට කුසල චිත්ත ඒකාග්‍රතාව තුළින් පිළිවෙළින් උපදවා ගත හැකි ධ්‍යාන සතරකි. එහි දෙවන ධ්‍යානය,
(1) පීති සුඛ ඒකග්ගතා සහිත ය.
(2) විතක්ක විචාර සහිත ය.
(3) විචාර පීති සුඛ ඒකග්ගතා සහිත ය.
(4) විතක්ක විචාර පීති සුඛ සහිත ය.
(5) සුඛ ඒකග්ගතා සහිත ය.

**39.** යෝගාවචරයකුට නීවරණාදී කෙලෙස් යටපත් කිරීමෙන් ලබාගත හැකි සමාපත්ති අටකි. ඒ අතර නෙවසඤ්ඤානාසඤ්ඤායතනය යනු,
(1) සතරවන අරූප ධ්‍යානයයි.
(2) විපස්සනාව තුළින් ලැබිය යුත්තකි.
(3) කිසිසේත් ම බිඳ නොවැටෙන ධ්‍යානයෙකි.
(4) ඍද්ධි ප්‍රාතිහාර්ය පෑමේ හැකියාවයි.
(5) බුදුසසුනෙන් බැහැරව ලැබිය නොහැක්කකි.

**40.** "යම් සේ සැරසෙන සුළු ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ ළදරුවෙක් හෝ තරුණයෙක් හෝ දීප්තිමත් කැඩපතක හෝ පහන් දිය බඳුනක සිය මුවසටහන පරීක්ෂා කර බලන්නේ ලප කැලැල් ආදී දොස් ඇති තැන් ඇතැ'යි ද නැති තැන් නැතැ'යි ද පැහැදිලි ව දකියි." මෙම උපමාව මගින් පැහැදිලි කරන්නේ,
(1) දිබ්බචක්ඛු ඤාණයයි.
(2) පස්වන සමාපත්ති ඤාණයයි.
(3) විපස්සනා ඤාණයයි.
(4) මනෝමය ඍද්ධි ඤාණයයි.
(5) චෙතෝපරිය ඤාණයයි.

**41.** "මෙම ක්‍රියාව අයහපත් ය මෙයින් අවැඩක් ම සිදු වෙයි. මෙය යහපත් ය මෙයින් සැපතක් ම වේ"යැ'යි නිශ්චය කරගනු සඳහා බුදු දහමෙහි බොහෝ මග පෙන්වීම් කර තිබේ. එබඳු එක් ධර්ම පාඨයක් නම්,
(1) පඤ්ඤාජීවිං ජීවිතමාහු සෙට්ඨං යන්න ය.
(2) ආරහථ නික්ඛමථ යුඤ්ජථ බුද්ධ සාසනේ යන්න ය.
(3) අප්පමාදෝ අමතපදං යන්න ය.
(4) සබ්බාකුසලධම්මපහීනෝ කුසලධම්ම සමන්නාගතෝ යන්න ය.
(5) යස්ස අස්සුමුඛෝරෝදං විපාකං පටිසේවති යන්න ය.

**42.** පහත දැක්වෙන ප්‍රකාශ අතරෙන් භක්තිය හා බෞද්ධ ශ්‍රද්ධාව පිළිබඳ ධර්මානුකූල ප්‍රකාශය තෝරන්න.
(1) ශ්‍රද්ධාවත් භක්තියක් සපුරා සමාන වේ.
(2) භක්තිය ශ්‍රද්ධාවේ පදනම ය.
(3) බෞද්ධයකු රත්නත්‍රය කෙරෙහි භක්තිමත් විය යුතු ය.
(4) බුදුදහමේ භක්තිය ගැන උගන්වා නැත.
(5) බොහෝ සූත්‍ර දේශනාවල භක්තිය අගය කර තිබේ.

**43.** ශීල ශික්ෂාව පිළිපැදීමෙන් මෙලොවදී මෙන්ම පරලොවදී ද ලැබෙන අනුසස් පහක් බුදුදහමෙහි දක්වා තිබේ. ඉන් එකක් නම්,
(1) සිල් රකින්නාට උසස් තනතුරු ලැබේ යන්නයි.
(2) සීල සමාදානයෙන් ම නිවන් පසක් කළ හැකිය යන්නයි.
(3) සිල්වත් තැනැත්තා චාරිත්‍ර පමණක් පිළිපදියි යන්නයි.
(4) ශීලය වතක් මෙන් ආරක්ෂා කළ යුතුය යන්නයි.
(5) සිල්වත් තෙමේ අප්‍රමාදී වන බැවින් මහත් වූ භෝගස්කන්ධයක් ලබයි යන්නයි.

**44.** නිබඳව ම පව්කම්වලින් වැළකී පින්කම් කළ යුතු බවත්, එමගින් බොහෝ සැප ලැබෙන බවත් බෞද්ධයෝ දනිති. එහෙත් ඔවුන් අතර දක්නට ලැබෙන එක් **වැරදි** ආකල්පයක් වන්නේ,
(1) පින මෙලොවට මෙන් ම පරලොවට ද විපාක ගෙනදෙයි යන්න ය.
(2) පින් කිරීම පැවිදි ජීවිතයට උපකාරී නො වේ යන්න ය.
(3) පින් කිරීමෙන් පමණක් නිවන් දැකිය නොහැකි ය යන්න ය.
(4) පින හා කුසල අතර අසමානතා තිබේ යන්න ය.
(5) පිංකම් කරන්නාට නුවණ ලැබේ යන්න ය.

**45.** කවරකුගේ වුව ද දියුණුවක් සැපතක් දුටු විට ඒ පිළිබඳ කිසිසේත් ම ඊර්ෂ්‍යා නොකළ යුතු අතර ඉන් සතුටට පත්විය යුතු ය. මෙම ගුණය හැඳින්විය හැක්කේ,
(1) මුදිතාව යනුවෙනි. (2) අර්ථචර්යාව යනුවෙනි. (3) මෙත්තාව යනුවෙනි.
(4) අප්පිච්ඡතාව යනුවෙනි. (5) උපේක්ෂාව යනුවෙනි.

**46.** ධනය ඉපැයීමේ පහසු මගක් සෙවූ තැනැත්තෙක් ඉවතලන කසල තේ, කුඩා ඇසුරුම්වල බහා අලෙවි කර සැපවත් ජීවිතයක් ගත කළේ ය. බුදුදහමේ උගන්වන නොකළ යුතු වෙළඳාම් අතරට නොවැටෙන බැවින්, "එය වරදක් නො වේ යැයි" ද හෙතෙම තර්ක කළේ ය. මේ පිළිබඳ ව කිව හැක්කේ,
(1) ඔහුගේ තර්කය නිවැරදි බවයි.
(2) එය මිච්ඡා ආජීවයක් බවයි.
(3) එය සම්මා කම්මන්තයක් වන බවයි.
(4) ඔහු හොඳ සැලසුමක් ඇති වෙළෙන්දකු බවයි.
(5) එය අත්ථි සුඛයට ඇතුළත් වන බවයි.

**47.** ධන පරිහරණයේ දී බෞද්ධයකු විසින් අනුගමනය කළ යුතු කරුණු රැසක් බුද්ධ දේශනාවන්හි විසිර තිබේ. එබඳු ධර්ම පාඨයක් වන්නේ,
(1) උට්ඨාතා වින්දතේ ධනං යන්නයි.
(2) ධනං සෙට්ඨංව රක්ඛති යන්නයි.
(3) නිස්සරණ පඤ්ඤො පරිභුඤ්ජති යන්නයි.
(4) ආරක්ඛෙන ගුත්තියා සම්පාදේති යන්නයි.
(5) විජිතේ අධනා අස්සු තේසංච ධනමුප්පාදෙය්‍යාසු යන්නයි.

**48.** බුදුදහම අනුව රාජ්‍ය පාලනය කළ යුත්තේ දසරාජ ධර්මයෙනි. එහි අජ්ජවං යන රාජධර්මයෙන් අදහස් වන්නේ,
(1) පරිත්‍යාගශීලී වීම ය. (2) අවංකව ක්‍රියා කිරීම ය.
(3) මුදු මොළොක් ආකල්ප ඇති බව ය. (4) ධනෝපායනයට උපකාර කිරීම ය.
(5) ජනතාවට ආරක්ෂාව ලබා දීම ය.

**49.** රාජ්‍යත්වය හා රාජ්‍ය පාලනය පිළිබඳ ඉගැන්වීම් ඇතුළත් සූත්‍ර දේශනා රාශියකි. ඒ අතර මෘගපක්ෂීන් ආරක්ෂා කිරීම රජුගේ වගකීමක් ලෙස දක්වා ඇත්තේ,
(1) රජ්ජ සූත්‍රයේ ය. (2) චක්කවත්තිසීහනාද සූත්‍රයේ ය.
(3) මහාපරිනිබ්බාන සූත්‍රයේ ය. (4) අධම්මික සූත්‍රයේ ය.
(5) අග්ගඤ්ඤ සූත්‍රයේ ය.

**50.** රාජ්‍ය පාලනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් අතර හමුවන සප්ත අපරිහානීය ධර්මවල සඳහන් පරිදි, පාලකයා විසින් ප්‍රජාවගේ යහපත උදෙසා ගතයුතු ක්‍රියාමාර්ගයක් වන්නේ,
(1) ධනෝපායන මාර්ග විවර කර දීම ය.
(2) පූජනීය ස්ථානවලට ගරුසත්කාර කිරීම ය.
(3) යුද භටයන්ට රක්ඛාවරණ ගුප්තිය සැලැස්වීම ය.
(4) මහජනයා වෙනුවෙන් ධනය පරිත්‍යාග කිරීම ය.
(5) ජනතාවගේ මානසික දියුණුවට අවශ්‍ය අනුග්‍රහය දැක්වීම ය.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2019

## පැරණි නිර්දේශය/ பழைய பாடத்திட்டம

| විෂය අංකය<br>பாட இலக்கம் | 41 | විෂයය<br>பாடம் | බුද්ධ ධර්මය |
|---|---|---|---|

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்
## I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 3 | 11. | 4 | 21. | 5 | 31. | 4 | 41. | 5 |
| 02. | 3 | 12. | 4 | 22. | 4 | 32. | 4 | 42. | 4 |
| 03. | 4 | 13. | 1 | 23. | 2 | 33. | 3 | 43. | 5 |
| 04. | 3 | 14. | 4 | 24. | 2 | 34. | 1 | 44. | 2 |
| 05. | 5 | 15. | 3 | 25. | 3 | 35. | 2 | 45. | 1 |
| 06. | 3 | 16. | 5 | 26. | 2 | 36. | 4 | 46. | 2 |
| 07. | 4 | 17. | 5 | 27. | 5 | 37. | 4 | 47. | 3 |
| 08. | 5 | 18. | 4 | 28. | 2 | 38. | 3 | 48. | 2 |
| 09. | 1 | 19. | 3 | 29. | 5 | 39. | 1 | 49. | 2 |
| 10. | 5 | 20. | 2 | 30. | 2 | 40. | 5 | 50. | 2 |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 02 ලකුණු බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 2 × 50 = 100

# II පත්‍රය

## I කොටස

01.

(i) **බුදුරදුන්ට විශේෂ වූ ඤාණාධිගමයන් දෙකක් නම් කරන්න.**

ඨානාඨාන, කම්මවිපාක, සබ්බත්ථගාමිණී පටිපදා, ඥාණාධිමුක්තික ආදී ඥාන අතුරින් දෙකක් නම් කිරීම.

*(ලකුණු 04)*

(ii) **'සත්ථා' බුදුගුණය හඳුන්වන්න.**

සත්ත්වයාට සසරින් එතෙරවීමට අවශ්‍ය පිළිවෙත පහදාදෙන බැවින් බුදුරදුන් සත්ථා නම් වන සේක. ඒ ඒ පුද්ගලයාගේ ඉන්ද්‍රිය වේමත්තතාව ආසයානුසය ආදිය සළකා ආචාර්යවරයෙකු වශයෙන් මග ගෙන්වීමට බුදුරදුන්ට ඇති හැකියාව මින් අදහස් වන බව.

*(ලකුණු 04)*

(iii) **'සත්තුස්සදෝ' යන මහා පුරුෂ ලක්ෂණය පැහැදිලි කරන්න.**

පිටි අත්දෙක, පිටිපතුල් දෙක, උරහිස් දෙක, කඳ යන සත් තැන උස්ව පිරිපුන්ව වැඩී ඇති බව සත්තුස්සදො යන්නෙන් කියවෙන බව.

*(ලකුණු 04)*

(iv) **'ආනුපුබ්බිකථා' යන්න විස්තර කරන්න.**

අනුපිළිවෙලින් දහම් දෙසීම මින් අදහස් කරන බව. එනම් දහම් කරුණු වශයෙන් සරල තැනින් ආරම්භකොට ගැඹුරු තැන දක්වා පියවරෙන් පියවර පැහැදිලි කිරීම. (දාන කථං සීල කථං .......) ශ්‍රාවකයන් පියවරින් පියවර නිවනට යොමුවන පරිදි දහම් දෙසීම. (අනුපුබ්බ සික්ඛා.........) වන බව.

*(ලකුණු 04)*

(v) **'බුදුරදුන් අන්තවාදියකු නො වේ.' විමසන්න.**

බුදුරදුන් සමකාලීනව පැවැති ශාස්වත අශාස්වත යනුවෙන් දෙයාකාර වූ දෘෂ්ටි නාමයෙන් හැඳින්වූ කිසිදු අන්තවාදයකට පක්ෂද විපක්ෂද නොවන බව. එම සියලු දෘෂ්ටි පසෙකින් තැබූ බව. මධ්‍යම දේශනාවද මධ්‍යම ප්‍රතිපදාවද ඉගැන්වූ බව යන කරුණු.

*(ලකුණු 04)*

02.

(i) **'ඕපනයිකෝ'දහම් ගුණය අර්ථ දක්වන්න.**

ඕපනයිකො-සමීපයට පමුණුවන, නිවනට පමුණුවන, තම සිත්හිලා පිහිටුවිය යුතු යන මූලික අර්ථවලින් දෙකක් දැක්වීම.

***(ලකුණු 04)***

(ii) **'බුදුසමය යථාර්ථවාදීය' පැහැදිලි කරන්න.**

බුදුසමය ඇත්ත ඇති සැටියෙන් දකියි. එබැවින් එහි ශාස්වතවාදයක් හෝ උච්ඡේදවාදයක් නොව ප්‍රකටවන්නේ යථාර්ථවාදයයි. ත්‍රිලක්ෂණය, චතුරාර්ය සත්‍ය පටිච්චසමුප්පාදය වැනි මූලික ඉගැන්වීම් ඇසුරින් මෙය පැහැදිලි කිරීම.

***(ලකුණු 04)***

(iii) **අනීශ්වරවාදී වීම බුදු දහමෙහි විශේෂ ලක්ෂණයක් බව පෙන්වා දෙන්න.**

බුදුසමය කවර ආකාරයකින් හෝ මැවුම්කාර දෙවියකු නොපිළිගනී. ඊශ්වරයෙකු ගැන නුගන්වයි. එබැවින් අනීශ්වරවාදීය. බුද්ධකාලීන භාරතීය වෛදික බ්‍රාහ්මණ ඊශ්වරවාදයට සාපේක්ෂව එය බුදුදහමේ විශේෂ ලකෂණයක් බව පෙන්වා දීම.

***(ලකුණු 04)***

(iv) **මෙලොව දියුණුවට අදාළ බෞද්ධ ඉගැන්වීම් සැකෙවින් දක්වන්න.**

අං.නි. ව්‍යග්ගපජ්ජ, අනන සීගාල, මහාමංගල යන සූත්‍ර දේශනා ඇසුරින් දෙකක්වත් භාවිත කොට මෙලොව දියුණුවට අදාළ බෞද්ධ ඉගැන්වීම් පැහැදිලි කිරීම.

***(ලකුණු 04)***

(v) **ආත්ම දෘෂ්ටිය පිළිබඳ බෞද්ධකල්පය ගෙනහැර දක්වන්න.**

බුද්ධකාලීන මහණ බමුණන් භව සංක්‍රමණික නිත්‍ය ආත්මයක් ඇතැයි පිළිගත් බව ප්‍රකටය. ඔවුන් අදාළ ප්‍රතිපදාවන් පෙළගස්වා තිබුණේ ආත්ම විමුක්තිය වෙත ළඟාවීමටයි. බුදුසමය අනාත්මවාදීය. නිත්‍ය වශයෙන් පවත්නා හෝ මරණයෙන් නිමවන හෝ ආත්මයක් ඇතැයි නොපිළිගනියි. සූත්‍රානුසාරයෙන් පැහැදිලි කිරීම අපේක්ෂිතය.

***(ලකුණු 04)***

03.

(i) **'ආජීවක' යන්න අර්ථකථනය කරන්න.**

ආජීවක යන්නෙන් නිරුවත් පිරිවැජියන් අදහස් වන බව. ශ්‍රමන සම්ප්‍රදායට අයත් බුද්ධකාලීන පැවිද්දන් අතර වඩාත් ප්‍රකට බව. නිරුවත්ව සිටීම තුළින් ඔවුන් අත්තකිලමතානුයෝගයට නැඹුරු වූ බව. මක්කලීගෝසාල ආජීවක නිකායේ ප්‍රධානියා වශයෙන් සැළකෙන බව.

*(ලකුණු 04)*

(ii) **'සාමීචිපටිපන්න' ගුණය පැහැදිලි කරන්න.**

ධර්මානුධර්ම ප්‍රතිපදාවට යෝග්‍ය වූ ස්වභාවය සාමීචි නම් වේ. එයට පිළිපන් බැවින් සඟරුවන සාමීචි පටිපන්නය. ත්‍රිවිධ ශික්ෂාවෙහි තියුණු අපේක්ෂා ඇතිව ආදර ගෞරවයෙන් පිළිවෙත් පුරන බැවින් සාමීචි පටිපන්නය.

*(ලකුණු 04)*

(iii) **ආරාම ප්‍රතිග්‍රහණය ආරම්භ වූ ආකාරය පෙන්වා දෙන්න.**

භික්ෂු සමාජය ආරම්භ වූයේ සංචාරක පැවිදි සංවිධානයක් ලෙසය. ක්‍රමයෙන් එම පැවැත්ම පීඩාජනක බව පසක් විය. මුල් අවස්ථාවේදී භික්ෂූහු අරණ්‍ය, වෘක්ෂමූල, පර්වත ආදියෙහි වාසය කළහ. එය දුටු රජගහනුවර සිටුතුමා බුදුරදුන්ගේ අනුදැනුම ඇතිව විහාර සැටක් කරවා පූජා කිරීමේ පුවත මෙහිදී විස්තර විය යුතුය.

*(ලකුණු 04)*

(iv) **'චතුර්විධ නිස්සය ධර්ම' කෙටියෙන් විස්තර කරන්න.**

පැවිද්ද නම් පාංශුකූල සිවුරු දැරීම පිණිසය. වෙනත් පිළියෙන් කළ සිවුරු අතිරේක වෙයි. පැවිද්ද නම් පිණ්ඩභාරයෙන් යැපීමටයි. වෙනත් පිඩු අතිරේක වේ. පැවිද්ද නම් රුක් මුල් හි වාසය පිණිසයි. සැකසූ ආරාමය අතිරේක වේ. පැවිද්ද නම් පූතිමුක්ත භේසජ්ජය පිණිසයි. වෙනත් ඖෂධ අතිරේක වෙයි. මෙය චතුර්විධ නිස්සය නම් වේ.

*(ලකුණු 04)*

(v) **'සාංඝික දේපළ ක්‍රමය' පිළිබඳ ප්‍රමාණවත් ඇගයුමක් කරන්න.**

ශාසනික ව්‍යවහාරය දේපළ පරිභෝග කිරීමට අනුදැන වදාළ පිළිවෙත සංඝික ක්‍රමයයි. එය පෞද්ගලික අයිතිය පසෙකින් තබයි. භික්ෂු සමාජය වැනි අල්පේච්ඡ පැවැතුම් ප්‍රකට කළ යුතු විරාගී දැක්මක් හා චරණයක් ඇති සංවිධානයකට මෙය වඩාත් උචිතය. විශේෂයෙන්ම සන්ධිකාර පරිභෝගය භික්ෂු ජීවිතයට හානියකි. ඒ අනුව භික්ෂු පරමාර්ථය හා ප්‍රතිපත්ති සුරැකෙන සාංඝික ක්‍රමය පුද්ගලික අයිතිය බැහැර ලා සාමුහික අයිතිය අර්ථවත් කරයි.

*(ලකුණු 04)*

## II කොටස

04.

(i) **'සුත්ත' යන පදයෙහි අර්ථ විභාග කරන්න.**

අරුත් දක්වන බැවින් ද, මනාකොට ප්‍රකාශ කරන ලද බැවින් ද, අසන බැවින් ද, පැසවන බැවින් ද, ධර්ම කරුණු එකිනෙක නූලක මෙන් අමුණා ඇති බැවින් ද සූත්‍ර යැයි කියන ලදී. මේ අතුරින් කරුණු හතරක් වත් දක්වා තිබීම.

*(ලකුණු 08)*

(ii) **අභිධර්ම පිටකයේ සැකැස්ම පිළිබඳ විස්තරයක් කරන්න.**

අභිධර්ම පිටකය ප්‍රකරණ සතකින් යුක්ත වන බව, එකී ප්‍රකරණ නම් කිරීම හා සැකෙවින් හැඳින්වීම මින් අදහස් කරන බව. අවම වශයෙන් ඒ ඒ ප්‍රකරණ හඳුන්වා ඇති නාම තේරුම් කිරීම අපේක්ෂිතය.

*(ලකුණු 12)*

05.

(i) **'වානප්‍රස්ථ-සන්‍යාසි' යන බ්‍රාහ්මණ ආශ්‍රමධර්ම හඳුන්වා දෙන්න.**

බමුණු සමයට අනුව චතුර්විධ ආශ්‍රම ධර්මවල අවසන් ආශ්‍රම දෙක වානප්‍රස්ථ හා සන්‍යාසි නම් වන බව. එම ආශ්‍රම ධර්ම පසුකාලීනව ශ්‍රමන නැගීමත් සමග බමුණන් අතර සම්භාවිත යැයි සැළකෙන බව. මෙම ආශ්‍රම ධර්ම මගින් ඥාන මාර්ගයට වැඩි නැඹුරුවීමක් පෙනෙන බව.

*(ලකුණු 08)*

(ii) **'බ්‍රහ්ම සහව්‍යතාව' පිළිබඳ ප්‍රමාණවත් විමසුමක් කරන්න.**

වෛදික - බ්‍රාහ්මණ ඉගැන්වීම් අනුව බ්‍රහ්ම සහව්‍යතාව යනු පරම නිෂ්ඨාවයි. විමුක්තියයි. වේද අධ්‍යයනය හා ඒ අනුව ක්‍රියා කිරීම. යාගහෝමාදිය සිදු කිරීම ඔස්සේ බ්‍රහ්ම සහව්‍යතාව එනම් බ්‍රහ්මයාගේ පරමාත්මය සමග එක්වීමට හැකියැයි බමුණු දහම උගන්වන බව. එයම විමුක්තිය සේ සැලකූ බව.

*(ලකුණු 12)*

06.

(i) **'දුක්ඛ නිරෝධාර්ය සත්‍යය' ධර්මානුකූලව පැහැදිලි කරන්න.**

දුක්ඛ නිරෝධය යනු නිවනයි. ජරාමරණාදී සංසාරගත දුක් දොම්නස්වල නිමාවයි. තණ්හාව නැති කිරීමයි. භව නිරෝධයයි. ලෝභ, ද්වේෂ හා මෝහා දී කෙලෙස් සපුරා බැහැර කිරීමයි. දේශනානු සාරයෙන් කරුණු දැක්වීම අපේක්ෂිතයි.

*(ලකුණු 08)*

(ii) **'ත්‍රිවිධ ශික්ෂාවෝ එකිනෙකට උපකාරී වෙති' විමසන්න.**

සීලය සීලය සඳහාම නොවේ. සමාධිය සඳහාය. සමාධිය ද ඒ සඳහාම නොවේ. ප්‍රඥාව සඳහාය. මෙසේ ත්‍රිවිධ ශික්ෂාවෝ එකිනෙකට උපකාරී වෙති. එක් ශික්ෂාවක් නැතිව අනෙක් ශික්ෂාව අර්ථවත් වන්නේ නැත. ත්‍රිවිධ ශික්ෂාවන් අන්‍යෝන්‍ය උපකාරිත්වයක් ඇති බව විමර්ශනාත්මකව දැක්වීම.

*(ලකුණු 12)*

07.

(i) **අනුලෝම පටිච්චසමුප්පාදය අනුව දුක්ඛ සමුදය පැහැදිලි කරන්න.**

චතුරාර්ය සත්‍ය අනවබෝධය හෙවත් අවිද්‍යාව ප්‍රත්‍යකොටගෙන කුසලාකුසල කර්ම හෙවත් සංස්කාර රැස්වීම. (අවිජ්ජා පච්චය සංඛාර) වේ. මෙසේ ද්වාදසාංගික පටිච්චසමුප්පාදයේ අනුලෝම දේශනාවෙහි එක් එක් අංගවල මූලික අර්ථ දක්වමින් එම හේතුප්‍රත්‍ය ඔස්සේ දුක්ඛ සමුදය සිදුවන බව පැහැදිලි කිරීම. (එවමෙතස්ස ................ දුක්ඛක්ඛන්ධස්ස සමුදයොහෝති)

*(ලකුණු 08)*

(ii) **'සමාජගත ගැටලු වුව ද පටිච්චසමුප්පන්නය' විමසන්න.**

දීඝ නිකායේ අග්ගඤ්ඤ සූත්‍රය චක්කවත්ති සීහනාද සූත්‍රය අං.නි. අධම්මික සූත්‍රය වැනි සූත්‍රවලින් දෙකක්වත් ඇසුරුකොට ගනිමින් සමාජගත ගැටළු පිළිබඳ හේතුප්‍රත්‍යාකාරය බුදුදහමේ පෙන්වාදී ඇති බව විමසීම.

*(ලකුණු 12)*

08.

(i) **ආර්ථිකය හා දේශපාලනය අතර ඇති සම්බන්ධය සූත්‍රානුසාරයෙන් පෙන්වා දෙන්න.**

ආර්ථිකය පිරිහීමෙන් රාජ්‍ය පාලනයද රාජ්‍ය පාලනය පිරිහීමෙන් ආර්ථිකයද පිරිහෙන ආකාරයත්, එසේම ඉන් එකක් දියුණු වීමෙන් අනෙකද දියුණු වන ආකාරයත් සූත්‍රානුසාරයෙන් පෙන්වා දීම. දී.නි. චක්කවත්තිසීහනාද, අග්ගඤ්ඤ, කූටදන්ත වැනි සූත්‍ර ඇසුරුකොට තිබීම සැළකිය යුතුය.

*(ලකුණු 08)*

(ii) **නීතිය හා සාමය සුරක්ෂිත කරනු පිණිස පාලකයකු කෙසේ ක්‍රියා කළ යුතුදැ'යි බුද්ධානුශාසනය ඇසුරෙන් සාකච්ඡා කරන්න.**

දසරාජ ධර්මවල අක්කෝධ, අවිහිංසා, ඛන්ති, අවිරෝධතා වැනි රාජ්‍ය පාලකයකුගේ ක්‍රියාකාරකම් ඔස්සේ ද දස සක්විති වත්වල සියලු ජන කොටස්වල රක්ෂාවරණ ගුත්තිය සැලසීම හා අධර්ම ක්‍රියා වැළැක්වීම වැනි කරුණු ඔස්සේ ද සප්ත අපරිහානිය ධර්මවල පැනවූ නීති නොකැඩීම හා නොපැනවූ නීති නොපැනවීම වැනි පිළිවෙත් ඔස්සේ ද ක්‍රියා කළ යුතුයැයි පාලකයන්ට අනුශාසනා කොට තිබීම සාකාච්ඡා විය යුතුය.

*(ලකුණු 12)*


LOL.lk
Learn Ordinary Level
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර
• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams
සමනල දැනුම
විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank
Master Guide
WWW.LOL.LK
CASH ON
DELIVERY
HOME
DELIVERY
Whatsapp contact
+94 71 777 4440
Website
www.lol.lk
Order via WhatsApp
071 777 4440